# ලංකාණ්ඩුවේ "ගැසට්" පත්‍රය.

ආණ්ඩුවේ අවසරයපිට ප්‍රසිද්ධකරණලදී.

නො. 8,048 — 1934ක්වූ මැයි මස 11 වෙනි දිනවූ සිකුරාද.


## Part IV.— හතරවෙනි කාණ්ඩය.

### ආණ්ඩුවේ ඉඩම් විකිණීම හෝ බදුදීම සඳහා දැන්වීම්.

**Badulla No. 143.**—ඌව දිසාවේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේ විසින් මෙහි පහත සඳහන්වෙන ආණ්ඩුව සන්තක ඉඩම් ආණ්ඩුවේ නියෝගවල ප්‍රකාරයට වර්ෂ 1934ක්වූ ජූනි මස 29වෙනි දිනවූ සිකුරාද පෙරවරු 10.30ට බදුල්ල කච්චේරියේදී වෙන්දේසිකර විකුණන්ට හෝ බිරුම්කරදෙන්ට නොහොත් වෙන අන්දමකින් තීන්දුකරන්ට යෙදෙනවා ඇත. ඌව දිසාවේ බදුල්ල පලාතේ උඩුකිඳ, වියළුව සහ වෙල්ලස්ස කොට්ඨාසවල පිහිටා තිබෙන බිම්කැබලි 9ක්.

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකමකියන්නා. | අන්දම. | මහත, අ. රූ. ප. | අක්කරයක මිල, රු. |
|---|---|---|---|---|---|---|
| | අන්තිම ගම් සිතියමේ නො. 56. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරළේ, කැටකැලේගම. | | | | | |
| 2B2 | අඹබලම්තැන්නේ හේන | — | ආණ්ඩුව, සීමාසහිත කාර්සන් සහ සමාගම විසින් අයුත්තේ අල්ලාගෙන තිබේ | අවුරුදු 15ක් පමණ පරණ තේ වැවිල්ලක් තිබේ | 0 0 22 | 710 |
| 2BB | කැටකැලේවත්ත | — | එම | අවුරුදු 12ක් පමණ පරණ තේ වැවිල්ලක් තිබේ | 0 1 20 | 710 |
| | අන්තිම ගම් සිතියමේ නො. 59. ගම—උඩුකිඳ දඹවිනිපලාතකෝරළේ දඹවින්න. | | | | | |
| 2I1 | දඹගොල්ල පතන | වැලිමඩ ඩී. ඇෆ්. ජේ. පෙරේරා | ආණ්ඩුව | පතන | 1 0 0 | 135 |
| | අන්තිම ගම් සිතියමේ නො. 108. ගම—උඩුකිඳ දෙහිවිනිපලාතකෝරළේ මහවෙලගම. | | | | | |
| 136x3 | ගමකපල්ලේපතන | — | ආණ්ඩුව, කින්රොස්වත්ත විසින් අයුත්තේ අල්ලාගෙන තිබේ | අවුරුදු 4ක් පමණ පරණ තේ වැවිල්ලක් තිබේ | 0 0 6 | 410* |
| | අන්තිම ගම් සිතියමේ නො. 344. ගම—වියළුව කොට්ඨාසයේ වියළුවකෝරළේ වක්කුඹුරේගම. | | | | | |
| 17 | රූක්අත්තනේ ගාවාහේන | සාර්තියා ගෞප්හි තන් ගමලේ පදිංචි ඩී. ඒ. සින්නසියා | ආණ්ඩුව | හේන | 1 0 31 | 35 |
| 5J | කොල්ලවත්ත | වක්කුඹුරේගෙදර ගන් ඇති | එම | උක්, මයිඤොක්කා, බතල සහ එළවළු වවා තිබේ | 0 1 20 | 60 |
| 5K | එම | වක්කුඹුරේ පදිංචි පිටත වත්තේගෙදර පුංචා | එම | අවුරුදු 5ක් පමණ පරණ කොස්පැළ සහ බතල මුළු ඉඩමේ වවා තිබේ | 0 0 7 | 45 |

| නො. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | අයිතිකාරකියන්නා. | අන්දම. | අක්කරයක මහත, අ. රූ. ප. | මිල, රු. |
|---|---|---|---|---|---|---|
| | මූල් සිතියමේ නො. A. 25. ගම—වෙල්ලස්සේ වැගම්පත්තුකෝරළේ රදලියද්දේගම. | | | | | |
| 1 | වටවලපිටිය නොහොත් වටවල පහත | පොල්වත්තේගෙදර එච්. ඇම්. බන්හැකරල | ආණ්ඩුව | දෙනිය | 1 0 1 | 35 |
| 3 | වටවලපිටිය | — | එම | එම | 0 2 12 | 35 |

* නො. 108වේ අන්තිම ගම් සිතියමේ නො. 136x3 දරණ බිම්කෑල්ල අයුක්තේ අල්ලාගත් අය විසින් මාසිමගල් තිබියදී අයුක්තේ අල්ලාගත් බැවින් රුපියල් 10ක් දඩයක් වශයෙන් ගෙවිය යුතුයි.

ඉහත සඳහන් ඉඩම්වල විකිණීම හෝ තීන්දුකිරීම ගැන වැඩිදුර විස්තර ඌව පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද, ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල්තුමාගෙන්ද ඉල්ලුම්කර ලබාගත හැකිය.

මේ 1934ක්වූ මැයි මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

---

මෙහි පහත සඳහන්කරණ ආණ්ඩුව සන්තක ඉඩම් කොටස් ආණ්ඩුවේ නියෝගවලට අනුව ඌව පළාතේ ආණ්ඩුවේ ඒජන්තඋන්නාන්සේ විසින් මේ 1934ක්වූ ජූලි මස 3වෙනි දින පෙරවරු 10.30ට බදුළු කච්චේරියේදී අවුරුදු 99කට වෙන්දේසියේදී බදු දෙනු ලැබේ.

මෙම විකිණීමේදී වැඩි ප්‍රිමියම් බද්ද ඉල්ලුම්කාරයා බදු ගැනුම්කාරයා වේ.

බද්දේ කොන්දේසි ඌව පළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඉඩම්වල සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ලබාගත හැක.

අන්තිම ටෝපෝ මූල් සිතියමේ නො. 25. ගම—බුත්තල පළාත බුත්තල කෝරළේ කතරගම.
විස්තර—ලඳුකැලෑව සහ කැලෑව.

| බිම් කැල්ල. | ඉඩමේ නම. | ඉල්ලුම්කාරයා. | ප්‍රමාණය, අ. රූ. ප. | අක්කරයකට මැනුම් ගාස්තුව, රූ. ශ. | වෙන්දේසිය පටන්ගන්න අක්කරයක ප්‍රිමියම් ගණන, රූ. ශ. | පළමු තිස් අවුරුද්දම අක්කරයකට අවුරුද්දක බද්ද. එක එක පළමු හය අවුරුද්දට, රූ. ශ. | පළමු තිස් අවුරුද්දම අක්කරයකට අවුරුද්දක බද්ද. එක එක ඉතිරි විසිහතර අවුරුද්දට, රූ. ශ. |
|---|---|---|---|---|---|---|---|
| 1AJ | පුරාණසෙල්ලකතරගම | බදුල්ලේවිහාරගොඩ ඒනා කදිරවෙල් | 2 0 4 | — | 3 36 | 3 36 | 3 36 |
| | මූල් සිතියමේ නො. A. 43. ගම—බුත්තල පළාත බුත්තලකෝරළේ අළුත්වෙලගම. විස්තර—හේන. | | | | | | |
| 1 | කන්ඩියේකනතත | අලුත්වෙල පදිංචි ජයසිංහ ආරච්චිගේ කරෝලිස් අප්පුහාමි | 1 0 1 | — | 2 40 | 0 80 | 2 40 |
| | විස්තර—හේන, කඳුරට ඉතුරුකර තිබේ. | | | | | | |
| 2 | එම | — | 0 1 6 | — | — | — | —* |
| | මූල් සිතියමේ නො. A. 45. ගම—බුත්තල පළාත බුත්තල කෝරළේ වගුරේවෙලගම. විස්තර—හේන. | | | | | | |
| 5 | වෙහෙරේයාය | මහවෙල පදිංචි මේනා දෙහ මාතික්කම් | 1 0 7 | — | 2 40 | 0 80 | 2 40 |
| | විස්තර—හේන, හුළුපාරට ඉතුරුකරතිබේ. | | | | | | |
| 6 | එම | — | 0 1 21 | — | — | — | —* |
| | විස්තර—හේන. | | | | | | |
| 4 | එම | මහවෙල පදිංචි මේනා දෙහ මාරිමුත්තු | 2 0 16 | — | 2 40 | 0 80 | 2 40 |
| | මූල් සිතියමේ නො. A. 22. ගම—උඩුකිඳ ගවිපළාත කෝරළේ පේරවැල්ලේගම. විස්තර—හේන. | | | | | | |
| 1 | කුඹුගලේකහටගහගා වාහේන නොහොත් ගල්පිලබොඩහේන | පේරවැල්ලේ පදිංචි කරු ණ සංගිලිගෙදර වදහං හිලි දුරයලාගේ මැනිකා | 0 2 1 | — | 6 60 | 2 20 | 6 60 |
| | මූල් සිතියමේ නො. A. 26. ගම—ගවිකිඳ රිල්පොල කෝරළේ කදහේ ඉහලගම. විස්තර—පතන, හුළුපාරට ඉතුරුකරතිබේ. | | | | | | |
| 1 | වටගොඩපතන | — | 0 0 19 | — | — | — | —* |
| | විස්තර—පතන සහ හේන. | | | | | | |
| 2 | එම | කදහේ පදිංචි ඇල්. ජේම්ස් අප්පු | 0 1 29 | — | 6 60 | 2 20 | 6 60 |
| | විස්තර—පතන, හුළුපාරට ඉතුරුකරතිබේ. | | | | | | |
| 3 | එම | — | 0 0 10 | — | — | — | —* |
| | විස්තර—පතන සහ හේන. | | | | | | |
| 4 | එම | කදහේ පදිංචි ඇල්. ජේම්ස් අප්පු | 0 1 15 | — | 6 60 | 2 20 | 6 60 |
| | අන්තිම ගම් සිතියමේ නො. 19. ගම—උඩුකිඳ මහපළාත කෝරළේ කිතිගම. විස්තර—කුඹුර, අයුක්තේ බුත්තිවිඳිති. | | | | | | |
| 8OR29 | වරල්වත්තේකුඹුර | බබිලිව්. ඇම්. අප්පුහාමි, කිතිගම ආරච්චි | 0 2 17 | — | 18 0 | 6 0 | 18 0 |

* මේ ලකුණ දරණ බිම්කෑලි ඉතුරුකිරීමටයි (බදුදීමට නොවේ).

ඉහත සඳහන් ඉඩම්කෑලිවල බද්ද ගැන වැඩිදුර විස්තර ඌවපළාතේ ආණ්ඩුවේ ඒජන්ත උන්නාන්සේගෙන්ද ඒවායේ සිතියම් සර්වෙයර් ජනරාල් උන්නාන්සේගෙන්ද ඉල්ලුම්කර ලබාගතහැක.

මේ 1934ක්වූ මැයි මස 2වෙනි දින කොළඹ ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේගේ කන්තෝරුවේදීය.

සී. වී. බ්‍රවුන්,
ඉඩම් පිළිබඳ කොමසාරිස් උන්නාන්සේ වෙනුවට.

## ආණ්ඩුවට ඉඩම් ලබාගැනීම සම්බන්ධ දැන්වීම.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දෙම්පේ බෙහෙත් ශාලාව පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතෙවනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A. 242. ගම—දෙම්පේ.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | මැදලන්දවත්ත .. | පොල්ගස් 7ක්ද, කොස්ගහක්ද, කජුගහක්ද, මෙසන්වැඩකරනලද ලිඳක්ද, බෙහෙත් ශාලාවකට පාවිච්චිකරන මෙසන්වැඩ කරනලද අතුසෙවිලිගෙයක් සහ මැටියෙන් බඳිනලද අතුසෙවිලි වැසිකිළියකින් යුත් පොල්ඉඩම | ඇම්. පී. බෙලේනිස් පෙරේරා, ඇම්. පී. හෙන්ද්‍රික් පෙරේරා, ඇම්. පී. ඇලිසා පෙරේරා සහ ඇම්. පී. බස්තියානා පෙරේරා, සියල්ලම දෙම්පේ | 0 0 17·7 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූලි මස 7වෙනි දින පෙරවරු 9යේ කනිසමට දෙම්පේ පිරිමි පාඨශාලාවේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 4වෙනි දින
කොළඹ කච්චේරියේදීය.

කාල් ඒ. ආන්ට්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දික්ඔය–මස්කෙලිය පාරේ "පොක්මන්ස් කෝනර්" නමැති වංගුව පළල්කිරීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතෙවනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

සිතියමේ නො. A 159. ගම—මධ්‍යම දිසාවේ මහනුවර පලාතේ දික්ඔයේ, හැටන්–දික්ඔය නගර සීමාවතුල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | — .. | මහපාර .. .. | සීමාසහිත දික්ඔයේ නත් සමාගම | 0 0 3·77 |
| 2 | — . | පාරේ කපලාරු බැම්ම .. .. | එම .. | 0 0 26·82 |
| 3 | — .. | එම .. .. | එම .. | 0 0 0·14 |
| 5 | — .. | එම .. .. | එම .. | 0 0 20·25 |
| 6 | වර්පනම් නො. 834රේ කොටසක් (පොලිසියේ බිම) | පොලිසියට පාවිච්චිකරණ ස්ථිර ගොඩනැගිල්ලක කොටසක්, කපලාරු කාණුවක කොටසක් සහ මිදුල | එම .. | 0 0 3·47 |
| 7 | — .. | අඩිපාර .. .. .. | එම .. | 0 0 0·40 |
| 8 | වර්පනම් නො. 823තේ කොටසක් (දික්ඔය වත්ත) | මුඩුබිම .. .. .. | එම .. | 0 0 2·07 |
| 9 | වර්පනම් නො. 832කේ කොටසක් (දික්ඔය වත්ත) | — .. .. | එම .. | 0 0 0·20 |
| 10 | — .. | පාරේ කපලාරු බැම්ම .. .. | එම .. | 0 0 10·17 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදු ජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූනි මස 22වෙනි දින පස්වරු 2යේ කනිසමට මහනුවර කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 8වෙනි දින
මහනුවර කච්චේරියේදීය.

ඩී. සී. ආර්. ගුණවර්ධන,
මහනුවර ආණ්ඩුවේ උප ඒජන්තතුමා.

---

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3කේ ආඥාපත්‍රයේ හත්වෙනි වගන්තියේ ප්‍රකාරයට ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—හිපන්කන්දේ ගමේ ආණ්ඩුවේ ස්වභාෂා පාඨශාලාවක් පිහිටුවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපත්‍රයේ" හතෙවනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් නිසිආකාර මට අණ ලැබීතිබේ, ඒ ඉඩමනම්:—

සිතියමේ නො. A 154. ගම—හිපන්කන්ද.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකාරකියන්නෝ. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | රුක්මල්ගහවත්ත නොහොත් දූවේවත්ත | අවුරුදු 75කටත් වැඩිනරමේ පොල්ගස් 18ක්ද, අවුරුදු 100ක් පමණ පරණ කොස්ගහක්ද, වයස 75ක් පමණ ඇති අඹගහක්ද, අතුසෙවිලිකල සෝකාල ගොඩනැගිල්ලක්ද මැටිබිත්ති සහිත වැසිකිළියක්ද, ලිඳක්ද යනාදිය අඩංගු පොල්ඉඩම | හිපන්කන්දේ සිරිසෝමරතන තෙරුන්නාන්සේ | 0 3 19·2 |

එබැවින් ඉඩම අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඕනෑකර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩමට අයිතිවාසිකම් ඇත්තාවූ සැමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූනි මස 8වෙනි දින පෙරවරු 10යේ කනිසමට ගාල්ලේ කච්චේරියේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියා සිටින්ට ඕනෑවා සහ මෙම ඉඩම වෙනුවට ඉල්ලා සිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඕනෑ බව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 3වෙනි දින
ගාල්ලේ කච්චේරියේදීය.

ජේ. ඩී. බ්‍රවුන්,
ආණ්ඩුවේ ඒජන්ත වර්යා.

වර්ෂ 1876ක්වූ අවුරුද්දේ නොම්මර 3යේ ආඥාපනතේ 7වෙනි වගන්තියේ ප්‍රකාරයට, ආණ්ඩුවේ කටයුත්තකට, එනම්:—දකුණු පලාතේ මාතර දිසාවේ වැලිගම් කෝරලයේ වටගෙදරමුල්ල යන ගමේ කප්පුවත්තේ පාඨශාලා ගොඩනැගිල්ලක් තැනවීම හා ඊට මාර්ගයක් තැනවීම පිණිස මෙහි පහත සඳහන්වෙන ඉඩම් ලබාගැනීම සඳහා ක්‍රියාකරණ පිණිස "වර්ෂ 1876යේ ඉඩම් ලබාගැනීමේ ආඥාපනතේ" හයවෙනි කාණ්ඩයේ කරතිබෙන පංගාර්තුවල ප්‍රකාරයට උතුමාණන්වහන්සේගෙන් තිසිආකාර මට අණ ලැබී තිබේ, ඒ ඉඩම්නම්:—

මුල් සිතියමේ නො. A 144. ගම—වටගෙදරමුල්ල.

| නො. | ඉඩමේ නම. | අන්දම. | අයිතිකමකියන්නා. | මහත, අ. රූ. ප. |
|---|---|---|---|---|
| 1 | ගොඩකොලගෙවත්ත | පොල්ඉඩම .. | කප්පුවත්තේ පදිංචි ටී. ඇස්. රයිහනතුම්මා, ඇම්. ඇල්. ඇම්. ඉස්මායිල් සහ යූ. ඇල්. ඇම්. ශෙරීෆ්පාලම්මා | 0 0 35·1 |
| 2 | උස්හැකැනනකොරටුව | එම . | කප්පුවත්තේ පදිංචි අයි. ඇල්. ඇම්. මරික්කාර්, ඇම්. කේ. ඇම්. ඉස්මායිල්, ඇම්. කේ. කාසිම්, ඇම්. කේ. අබ්‍රහිම්, ඇම්. කේ. පාතුරමා නාච්චියා සහ අයි. ඇල්. ඇම්. හබීබු නාච්චියා | 0 0 27·3 |
| 3 | කොහිලවත්ත .. | එම .. | වටගෙදරමුල්ලේ පදිංචි අයි. ඇල්. ඇම්. මරික්කාර්, අයි. ඇල්. ඇම්. හබීබු නාච්චියා, ඒ. බී. මොහමදු බවා, ඇම්. කේ. ඇම්. ඉස්මායිල් සහ ඇම්. ඇල්. ඇම්. ඉස්මායිල් | 0 0 5·8 |

එබැවින් ඉඩම් අයිතිකරගැනීමට ආණ්ඩුවේ කල්පනාව තිබෙන බව පොදුජනයාට දැනගැන්ම සඳහා හත්වෙනි වගන්තියේ ඔහැකාර තිබෙන හැටියට මෙයින් දැනුම්දෙමි.

ඉහතකී ඉඩම්වලට අයිතිවාසිකම් ඇත්තාවූ සෑමදෙනම තමුන්ම නොහොත් තමුන් වෙනුවට ක්‍රියාකරණ අය වර්ෂ 1934ක්වූ ජූනි මස 21 දින පෙරවරු 11ගේ කාලසමයට වැලිගම කානායමේදී මා ඉදිරිපිටට පැමිණ ඒ කොයි අන්දමේ අයිතිවාසිකම්ද කියා කියාසිටින්ට ඔහැවා සහ මෙම ඉඩම් වෙනුවට ඉල්ලාසිටින මුදල් ගණනත් ඊට ඇත්තාවූ තමුන්ගේ අයිතිකමේ තොරතුරුත් කියාසිටින්ට ඔහැබව මෙයින් දැනගත යුතුයි.

වර්ෂ 1934ක්වූ මැයි මස 5වෙනි දින
මාතර කච්චේරියේදීය.

ඇල්. ඇල්. හන්වර්,
ආණ්ඩුවේ උප ඒජන්ත වර්යා.

PRINTED AT THE CEYLON GOVERNMENT PRESS, COLOMBO.